# තිරසර සංවර්ධනය
# (Sustainable Development)
# සඳහා අධ්‍යාපනය පිළිබඳ හැඳින්වීමක්.

**- ආචාර්ය වරදිවෙල විජයසුමන හිමි**

ප්‍රවේශය :-

තිරසර සංවර්ධනය (Sustainable Development) සංකල්පය පිළිබඳ අදහස මුලින්ම ඉදිරිපත් වූයේ 1987 දී පළකළ පරිසරය හා සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසමෙහි (World Commission on Environment & Development: 1987) වාර්තාවෙනි.[1] වර්තමාන හා අනාගත පරපුරෙහි යහපත සඳහා ලොව පුරා ක්‍රියාත්මක වන සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ ආකල්ප හා ප්‍රතිපත්ති යළි සැකසීමට උචිතම උපාය මාර්ගය ලෙස තිරසර සංවර්ධන සංකල්පය නූතනයෙහි පිළිගැනේ. තිරසර සංවර්ධනය යනු, අනාගතයේ ලොව ජීවත්වන සමස්ත මිනිස් පරපුරට ඔවුන්ගේ සියලු අවශ්‍යතා හා අපේක්ෂා සපුරා ගැනීමට හැකිවන පරිදි වර්තමානයේ ජීවත්වන මිනිසුන්ගේ අවශ්‍යතා සංවර්ධනය කිරීමයි. ඒ අනුව අනාගත පරපුරට සිය සියලු අවශ්‍යතා ඉටුකර ගැනීමට වර්තමානයේ පවත්නා සම්පත්හි විභවතා තවදුරටත් පවත්වාගෙන යාමට අවකාශ සැලසෙන පරිදි, වත්මන් පරපුරෙහි සියලු ඉල්ලුම් හා අවශ්‍යතා සපුරාලන අයුරු මිනිසා විසින් සිය පරිසරය, ජෛව ගෝලය, මෙන්ම ආර්ථික සම්පත් හා සංස්කෘතික අංග පරිභෝජනයට මෙන්ම සංරක්ෂණයට යොමුවීම මෙම සංකල්පයෙන් ප්‍රකටවන ක්‍රියාවලිය තුළ අන්තර්ගත හරය වේ.

තිරසර සංවර්ධනය සහිත අනාගතයක් පිළිබඳව අවබෝධය ලබාදීම සඳහා වැදගත් උපාය මාර්ගයක් ලෙස අධ්‍යාපනය හඳුනාගැනේ. තිරසර සංවර්ධනය සඳහා මිනිසුන් හැඩගැස්වීම, පුහුණු කිරීම හා ඒ පිළිබඳව අවදි බවක් ඇතිකරලීම සඳහා උචිත අධ්‍යාපනයක් ලබානොදී මෙම පරමාර්ථය සඵල කරගත නොහැකි බවට විශ්වාසය පළ කෙරේ. මේ නිසාම එක්සත් ජාතීන්ගේ මහ සමුළුව විසින් 2002 දී තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය පිළිබඳ දශකයක් (2005-2014) නම් කරනු ලැබීය. එමගින් ඉඟි කරනුයේ තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ කැපකිරීම කෙතෙක් වියයුතු ද යන්නයි.

තිරසර සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනය මූලික වශයෙන් සමාජ සම්මත අගයයන් සුරැකීම, පරිසරය ආශ්‍රිත සම්පත් සුරැකීම, ආර්ථික සම්පත් සුරැකීම සඳහා යොමු වූවකි. මේ අනුව අධ්‍යාපනයේ දැක්ම විය යුත්තේ සංස්කෘතික සම්ප්‍රදායයන් හා බැඳුනු මානව හා ආර්ථික සමතුලිත බව ඇති කිරීම හා පෘථිවිය සතු ස්වභාවික සම්පත් සුරැකීම සඳහා පුද්ගලයන් හුරුකරවීම හා පුහුණු කරවීමය. ආර්ථික, සාමාජික, පාරිසරික හා සංස්කෘතික යන ක්ෂේත්‍ර ඔස්සේ අධ්‍යාපනය මගින් තිරසර සංවර්ධනය පිළිබඳ අදහස් ජනතාව වෙත ගෙන යා යුත්තේ ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා පිළිබඳ නිපුණතා නිර්මාණය කිරීම හා වර්ධනය කරලීම අරමුණු කරගෙනය. එමගින් සාධනීය හා සාධාරණ අනාගතයක් සඳහා පුරවැසියන් පුහුණු කිරීමද සිදු කළ යුතු බව අවධාරණය කෙරේ.

ඒ අනුව මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ මූලික අරමුණු වන්නේ වර්තමාන අධ්‍යාපන සංකල්ප හා උපාය මාර්ගයන්හි ඵලදායී භාවිතය මගින් තිරසර සංවර්ධනය පිළිබඳ ක්‍රියාවලිය සඳහා උචිත වූ ප්‍රවේශයක් වෙත යොමුකරලීම සඳහා මගපෙන්වීමයි.

### තිරසර සංවර්ධන සංකල්පයෙහි ප්‍රභවය

තිරසරත්වය (Sustainability) තිරසර සංවර්ධනය (Sustainable Development) යන සංකල්ප දෙකම වනාන්තර හා සම්බන්ධ



"Sustainable Yield" යන්නෙන් බිඳී ආවක් ලෙස සැලකේ. එහි ප්‍රභවය ක්‍රි.ව. 1713 තරම් පැරණි වූවක් බවද දැක්වේ.[2] තිරසරත්වය (Sustainability) පිළිබඳ සංකල්පය සම්පත් පරිභෝජනය හා ප්‍රති නිෂ්පාදනය පිළිබඳ සමතුලිත බව යන හැඟීමෙන් වනාන්තර පිළිබඳව 12 වැනි සියවස සිට 16 වැනි සියවස් දක්වා කාලය තුළ අදාළ කරගත් අයුරු විවිධ මූලාශ්‍රයන් හි සඳහන් වේ.[3]

"Sustainability" යන්න "Sustainable Yield" යන්නෙහිම ව්‍යාප්තියක් හා මාරුකිරීමක් මෙන්ම අර්ථ විචාරමය නවීකරණයක් ලෙස විද්වත්හු සලකති. ලොව පුරාම පිහිටි වනාන්තර පිළිබඳව අධ්‍යයන කළ අය විසින්, ධර්මය, හා සමානම ශුද්ධ වස්තුවක් ලෙස මෙම සංකල්පය සැලකූ බවද පැහැදිලිය.

වන විද්‍යාව පිළිබඳව ප්‍රමුඛ පෙළේ ඇමෙරිකානු විශේෂඥයකු වන "William A Duevr" විසින් වනාන්තර පිළිබඳව දිගුකාලීන ඵලදාව (Sustainable Yield Forestry) යන්නෙහි හරය මෙසේ විස්තර කරයි.

"අපෙන් පැවත එන්නන්ට අපේ යුතුකම් ඉටුකිරීමට හැම පරපුරක්ම එහි සම්පත් ඉහළ මට්ටමකින් නඩත්තු කළ යුතු අතර ක්ෂය නොකොට ඔවුන් අතට පත්කළ යුතු වේ. දැව පිළිබඳ ඵලදායිතාව මිනිසාගේ වඩාත් මූලික වූ අවශ්‍යතාවකි. ඒ ඵලදායි ජීවිතයක් සඳහාය."[4]

මෙම අදහස බ්‍රැන්ට්ලන්ඩ් ක්‍රමයේ කදිම අපේක්ෂණයක් ලෙස සැලකීම උචිතය.

තිරසර සංවර්ධන සංකල්පයේ පමණක් නොව එහි වර්තමාන අර්ථනිරූපණයන්ගේද, මූලයන් වනාන්තර කළමනාකරණයෙහි විද්‍යමාන වේ. ශක්තිමත් තිරසරත්වය, ස්වාභාවික ප්‍රාග්ධනය පිළිබඳ උනන්දුවෙන් තනිකරවම ඇත්ව ජීවත්විය යුතුය යන කොන්දේසිය පනවයි.

කෙසේ වුවත් තිරසරත්වය පිළිබඳ සංකල්පය බොහෝ පැරණි වූවකි. ක්‍රි.පූ. 400 දී පමණ ඇරිස්ටෝටල් ගෘහ ආර්ථිකය පිළිබඳව

අදහස් දක්වමින් මේ හා සමාන ගෘහ ආකල්පයක් ගැන කථාකර ඇත. මෙම ග්‍රීක සංකල්පය නූතන සංකල්පයෙන් වෙනස් වේ. එහෙත් ගෘහ මූලිකයා යම් තරමක් දුරට ස්වයං තිරසර බවක් රඳවාගත යුතු වන අතර පරිභෝජනය කෙරෙහි පමණක්ම යොමුවූවෙක් නොවිය යුතුය.[5]

තිරසර බව යන යෙදුම ප්‍රථම වරට නූතන අදහසින් භාවිතා කරන ලද්දේ 1972 මාර්තු මාසයේදී පමණ Dennis & Donella - Meadows ප්‍රමුඛ විද්‍යාඥයන් පිරිසක් සකසන ලද "Limits to Growth" නම් වාර්තාවෙනි. එහිදී "State of global equilibrium" යන්න විස්තර කිරීමේදී කතුවරුන් විසින් "Sustainable" යන වචනය භාවිතා කරන ලදී.[6]

## තිරසර සංවර්ධනය සංකල්පය හා එහි ස්වභාවය

තිරසර බව පිළිබඳ සංකල්පය ආර්ථික සංවර්ධනය, පාරිසරික ගුණාත්මක භාවය හා සමාජීය සාධාරණත්වය අතර පවත්නා සම්බන්ධතාව ගවේෂණය කරයි. මෙම සංකල්පය පිළිබඳ මුලින්ම අවධානය යොමු වූයේ 1972 දී ජීවිතයේ ගුණාත්මක ස්වභාවය හා පාරිසරික ගුණාත්මක භාවය අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ ස්ටොක්හොම් හිදී පැවැත්වූ මානව පරිසරය පිළිබඳ වූ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණයේදීය. කෙසේ වුවත් තිරසර සංවර්ධනය සංකල්පය 1987 දී පරිසරය හා සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසමේදී අර්ථකථනය කෙරෙන තුරු අවධානයට ලක් වූයේ සුළු වශයෙනි. ඒ අනුව අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට ඇති ශක්‍යතාවන්ට බාධා නොවන අයුරින් වත්මන් පරපුරේ අවශ්‍යතා ඉටුකරගන්නා සංවර්ධනය තිරසර සංවර්ධනය නම් වේ.

"Development that can meet the needs of the present generation without - compromising the ability of future generations to meet their own needs"

(World Commission on Environment & Development; 1987; 43)



ස්වභාවික පරිසරයේ ප්‍රතිඋත්පාදනය කිරීමේ හැකියාව හා ආර්ථික හා සමාජ අවශ්‍යතා සමතුලිත කිරීමේ හැකියාව සහිතව තීරණ ගැනීමේ අවශ්‍යතාව මෙම නිර්වචනය මගින් අවධාරණය කෙරෙන බව පෙනේ. සම්පත් සුරාකෑම, ආයෝජනය මෙහෙයවීම, තාක්ෂණික සංවර්ධනය හඳුන්වාදීම යන අංශයන්හි වෙනස්වීම් මෙන්ම අනාගත හා වර්තමාන අවශ්‍යතාවන්හි වෙනස්වීම් ද තිරසර සංවර්ධන ක්‍රියාවලිය මගින් අපේක්ෂා කෙරේ.[7]

## තිරසර සංවර්ධනයේ අංග

තිරසර සංවර්ධන ක්‍රියාවලිය අංග තුනකින් සමන්විත වේ.

1. ආර්ථික තිරසරත්වය
2. පාරිසරික තිරසරත්වය
3. සමාජ තිරසරත්වය

මෙම අංග තුන එකට එක්ව ක්‍රියාත්මක වේ. වෙන්ව ක්‍රියාත්මක වීම සිදු නොවිය යුත්තකි. උදාහරණයක් ලෙස සෞඛ්‍ය සම්පන්න සමෘද්ධිමත් සමාජයක් රඳා පවතිනුයේ ආහාර, අනෙකුත් අවශ්‍යතා, පිරිසිදු පානීය ජලය, පිරිසිදු වාතය රටක වැසියන්ට සැපයිය හැකි පරිසරයක පමණි. පාරිසරික, සමාජීය හා ආර්ථික අංශයන්හි සමතුලිත බව සංවර්ධනය හා ජීවිතයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා දරණු ලබන උත්සාහයේදී තිරසර බව යනු අනාගතය පිළිබඳ සිතා බැලීම සඳහා වූ මනා ආදර්ශයකි.[8] මෙම ප්‍රවේශ පිළිබඳව අදහස් දක්වන ලෝක බැංකුවේ ආර්ථික විශේෂඥයකු වන මොහාන් මුණසිංහ ප්‍රාග්ධන සංචිත ස්ථාවරව පවත්වාගෙන යාම හෝ වර්ධනය කිරීමේ නිරත වන 'අතරම ආදායම වැඩි කිරීම ආර්ථික ප්‍රවේශයෙන් අපේක්ෂා කරයි. ජෛවීය හා භෞතික පද්ධතීන් නැවත ප්‍රකෘති තත්වයට පත්කිරීමේ හැකියාව හා ශක්තිමත් බව පවත්වාගෙන යාම පාරිසරික ප්‍රවේශයෙන් අදහස් කෙරෙන බවත් සමාජීය හා සංස්කෘතික පද්ධතීන්හි ස්ථාවර භාවය පවත්වාගෙන

යාම සමාජ හා සංස්කෘතික ප්‍රවේශයන්හි අපේක්ෂාව බවත් විස්තර කරයි.[9]

ආර්ථික ප්‍රවේශයෙන් තිරසර සංවර්ධන සංකල්පය විග්‍රහ කරන විට අනාගත ජීවන මට්ටම පවත්වාගෙනයාමේදී හෝ වර්ධනය කිරීමේදී භාවිතා කරනු ලබන අරමුණු කෙරෙහි වර්තමාන තීරණ අයහපත් බලපෑමක් ඇති නොකළ යුතු බව දැක්වේ.[10] මේ අනුව තිරසර සංවර්ධනය යනු පුද්ගල ජීවිතයන්හි ගුණාත්මක බව වැඩි කිරීම හා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවම මට්ටමේ සම්පත් භාවිතය සහිතව, අනාගත පරපුර සඳහා ස්වාභාවික සම්පත් හා අනෙකුත් සම්පත් පරිභෝජනයට ගැනීම බව පැහැදිලිය.

## තිරසර සංවර්ධනය පිළිබඳ මූලධර්ම

තිරසර සංවර්ධනය පිළිබඳව කරණු ලබන අධ්‍යයනයක දී ඒ සඳහා පාදක වූ මූලධර්ම පිළිබඳව අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. පරිසරය හා සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනය එවැනි මූලධර්ම දහඅට (18) ක් සඳහන් කරයි.[11]

සමස්තයක් ලෙස ගත් කල්හි එම මූලධර්ම බොහෝමයක්ම පරිසරය හා සම්බන්ධ වූ ඒවා වීම විශේෂයකි. සෞඛ්‍ය සම්පන්න බව, සමාජ සංරක්ෂණය, අධිපරිභෝජනයෙන් වැළකීම, ආර්ථික පිළිවෙත් ආදිය පිළිබඳව ද එහි අවධානයට ලක්ව ඇත.

එම මූලධර්මයන්ගෙන් සමහරක් මෙසේය.

- ස්වභාව ධර්මය හා ඒකාත්මිකව බැඳුනු සෞඛ්‍ය සම්පන්න හා ඵලදායී ජීවිතයක් කෙරෙහි ජනතාව යොමු කිරීම.
- වර්තමානයේ පවත්නා සංවර්ධන ක්‍රියාවලිය වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ සංවර්ධන හා පාරිසරික අවශ්‍යතා සඳහා හානිකර නොවීම.
- පාරිසරික හානියක් නොවන පරිදි ඔවුන්ගේ සම්පත් වලින් ප්‍රයෝජන ලැබීමට පරම අයිතිය ඒ ඒ ජාතීන්ට ඇති බව.



- තිරසර සංවර්ධනය ලැබීමට නම් පාරිසරික ආරක්ෂාව සංවර්ධන ක්‍රියාවලියෙහි අනිවාර්ය අංගයක් විය යුතුය. එයින් වියුක්ත සංවර්ධන ක්‍රියාවලියක් නොමැත.
- සෑම ජාතියක්ම සෞඛ්‍ය හා පාරිසරික පද්ධතියෙහි ඒකාග්‍රතාව රැකීම හා සංරක්ෂණය හා පිළිසකර කිරීම සඳහා සාමූහිකව ක්‍රියාකළ යුතුය.
- දැරිය නොහැකි නිෂ්පාදන හා පරිභෝජන රටා ජාතීන් විසින් මුලිනුපුටා දැමිය යුතුය.
- සාමය, සංවර්ධනය හා පාරිසරික සුරක්ෂිතතාව අන්‍යෝන්‍යව රඳා පවතින අතර ඒවා බෙදා වෙන්කළ නොහැකිය.

මෙලෙස රියෝ මූලධර්ම මගින් දේශීය වශයෙන් උචිත හා සංස්කෘතික වශයෙන් සුදුසු තිරසර සංවර්ධන ක්‍රියාවලියක් වෙත ජාතීන් හා කලාපයන් හා ප්‍රජාවන් යොමු කරලීම උදෙසා උචිත මානයක් ප්‍රකට කරයි. මෙම මූලධර්ම තිරසර සංවර්ධනය පිළිබඳව වූ වියුක්ත සංකල්ප ග්‍රහණය කරලීමට උපකාරී වේ. එසේම මූලධර්ම ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට ද උපකාරී වේ.

## තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ ඉතිහාසය

1987 දී ප්‍රථම වරට තිරසර සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ මහා සභාවේදී අවධානයට ලක්වූ අවස්ථාවේ ඊට සමාන්තර සංකල්පයක් ලෙස තිරසර සංවර්ධනය උදෙසා ආධාරකයක් ලෙස අධ්‍යාපනය සංකල්පය පිළිබඳව ගවේෂණය ආරම්භ විය. 1987 සිට 1992 දක්වා තිරසර සංවර්ධන සංකල්පය විවිධ සාකච්ඡා ඔස්සේ පරිණත තත්වයට පත්විය. අවසානයේදී Agenda 21 ප්‍රකාශනයේ පරිච්ඡේද සතළිසක් (40) අනාවරණය කෙරිණි. Agenda 21 ප්‍රකාශනයේ 36 පරිච්ඡේදය මගින් තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපන සංකල්පය පළමුවරට එළි දැක්විණි.[12]

බොහෝ අධ්‍යාපන ප්‍රකාශන ව්‍යාපාරයන්ට වඩා තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය ආරම්භ කරන ලද්දේ අධ්‍යාපන ප්‍රජාවට බාහිර වූ පුද්ගලයන් වීම විශේෂයකි. සැබවින්ම එය බිහිවූයේ ජාත්‍යන්තර ආර්ථික කේන්ද්‍රයන් මගිනි. උදාහරණ වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය, ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානය, වැනි සංවිධාන විසිනි.[13]

## තිරසරත්වය උදෙසා අධ්‍යාපන ප්‍රවේශය

තිරසර සංවර්ධනය හා අධ්‍යාපනය අතර පවතිනුයේ සංකීර්ණ සම්බන්ධතාවකි. සාමාන්‍යයෙන් පර්යේෂණයන් මගින් ප්‍රකට කරන්නේ මූලික අධ්‍යාපනය යනු තිරසර සංවර්ධනය පිළිබඳව ජාතීන්ගේ හැකියාව වර්ධනය කිරීමට හා තිරසරත්වය පිළිබඳ ඉලක්ක ළඟා කරගැනීම සඳහා ප්‍රධානම සාධකය වන බවයි. එමෙන්ම කෘෂිකාර්මික ඵලදායිත්වය, කාන්තාවන්ගේ තත්වය දියුණු කිරීම, ජනගහන වර්ධන අනුපාතය අඩුකිරීම, පාරිසරික ආරක්ෂණය දියුණු කිරීම, හා ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා අධ්‍යාපනය මූලික වන බව පර්යේෂණයන් මගින් අනාවරණය කෙරේ. සාක්ෂරතාව හා ගණිත හැකියාව ගොවීන්ට නව කෘෂිකර්ම ක්‍රමයන්ට හුරුවීමටත් අවදානම් සහිත අවස්ථාවකට මුහුණදීමටත්, වෙළඳපොළ සංඥාවන්ට ප්‍රතිචාර දැක්වීමටත් අවශ්‍ය හැකියාව ලබා දේ. සාක්ෂරතාව ගොවීන්ට පොහොර, කෘෂිරසායන මිශ්‍ර කරගැනීමට හා භාවිතයට උපකාරී වේ. අනෙක් අතට නිෂ්පාදකයන්ගේ උපදෙස් අනුව, පරිසරය හා මානව සෞඛ්‍ය සම්බන්ධ අවදානම් අඩුකිරීමටත් හේතුවේ.

අධ්‍යාපනය සෘජු ලෙසම තිරසරත්වය පිළිබඳ පහත ක්ෂේත්‍ර තුන කෙරෙහි බලපෑම් කරයි.

I. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

II. තීරණ ගැනීම.

III. ජීවිතයෙහි ගුණාත්මක බව.



I. උගත් පුරවැසිභාවය තිරසර සංවර්ධනය පිළිබඳ පුළුල් වූ ක්‍රියාවලියක් ඉටු කරයි. සත්‍ය වශයෙන්ම ජාතික තිරසරත්වය පිළිබඳ සැලසුම් වර්ධනය කිරීමට එහි පිළිවෙත් ජාතියේ පුරවැසියන් ලද අධ්‍යාපනික මට්ටම මගින් හෝ සීමා කිරීමට හැකිය.ඉහළ සාක්ෂරතාව පිළිබඳ අනුපාත හා නුපුහුණු විකල්ප වැඩ බලකාය මගින් සංවර්ධනය පිළිබඳව අඩු අවස්ථා ඇති කරනු ලබන බවද පෙනේ.

II. තීරණ ගැනීම - ප්‍රජා පාදක තීරණ සමාජ, ආර්ථික හා පාරිසරික යහපැවැත්ම ද රඳාපවතිනුයේ උගත් පුරවැසියන් මතය. සංවර්ධන විකල්ප විශේෂයෙන්, හරිත, සංවර්ධන විකල්ප පුළුල් වන්නේ අධ්‍යාපනයේ වර්ධනයත් සමගය.

III. අධ්‍යාපනය ජීවිතයන්හි ගුණාත්මක බව වර්ධනය සඳහා කේන්ද්‍රීය වේ. අධ්‍යාපනය පවුල්වල ආර්ථික තත්වයන් නගා සිටුවයි. ජීවන තත්වය වර්ධනය කරයි. ළදරු මරණ අනුපාතය පහළ මට්ටමට ගෙනයයි. ඊළඟ පරපුරෙහි ආර්ථික හා සමාජ යහපැවැත්ම පිළිබඳ අවස්ථා නංවයි. අධ්‍යාපනය පුද්ගල හා ජාතික තත්වයන් වර්ධනය කරයි.

තවදුරටත් මේ පිළිබඳව අවධානය යොමු කළ විට පැහැදිලි වන්නේ තිරසර සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනය අත්‍යයන්තයෙන්ම විපර්යාසකාරක ස්වභාවයකින් යුතු ක්‍රියාවලියක් බවය. එය හුදෙක් මිනිස් චර්යාවන් සමග පමණක් ගනුදෙනු නොකරන්නකි. යහපත් ලෝකයක් ගොඩනැගීම ඉලක්ක කරගත් ප්‍රධාන වශයෙන්ම විශ්වීය දැක්මක් ඉලක්ක කරගත් සාධනීය ප්‍රවේශයකි.

තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ අරමුණ වන්නේ අනාගතය සඳහා පාරිසරික, ආර්ථික හා සමාජීය අපේක්ෂණයන්ට ගරු කරන, තිරසර සමාජයකට ඉඩසැලසෙන සමාජයක් බිහිකිරීමයි. මෙම ක්‍රියාවලියේ අවධානය යොමු වන්නේ දේශීය මෙන්ම ජාතීය හා විශ්වීය වශයෙන් ඔවුන්ගේ අයිතීන් හා වගකීම්

සහිත පුරවැසියන් හැඩගැස්වීම සඳහායි. සෞඛ්‍ය සම්පන්න ශික්ෂිත ජීවන රටාවක් සහිත පුරවැසියන් හැඩගැස්වීම මෙන්ම දිළිඳු බව, සනීපාරක්ෂාව පිළිබඳ සහතික වීම හා ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම ද මෙම අධ්‍යාපනමය ක්‍රියාවලියෙන් අපේක්ෂා කෙරේ. ඒ අනුව යුනෙස්කෝ සංවිධානය තිරසර සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනික ක්‍රියාවලිය මෙසේ නිර්වචනය කරයි.

> "සෑම පුද්ගලයෙකුටම තිරසර අනාගතයක් නිර්මාණය කිරීමෙහිලා ඉගෙනීම හා අනෙකුත් අධ්‍යාපන අවස්ථාවලින් යහපත් ප්‍රතිඵල ලබාගැනීමට ඉඩ පහසුකම් සහිත වේගවත් සහ මිල අධික ව්‍යාපෘතීන් සහිත ලෝකයක් පිළිබඳ කල්පනා කිරීමකි."[14]

තිරසර සංවර්ධනය සඳහා වූ අධ්‍යාපන ක්‍රියාවලිය අධ්‍යාපන පද්ධතීන් හා සමෝධානික අංගයක් වීමට නම් පහත සඳහන් කාර්යයන් ඉටුකළ යුතු බව පිළිගැනේ.

1. තිරසරත්වය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව ජනතාව තුළ අවදි බව වර්ධනය කිරීම.
2. තිරසර සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනය පිළිබඳ සාධක හා ඉගෙනීම් ක්‍රියාවලින් සමග පවත්නා වැඩ සටහන් පුනර් දිශාගත කිරීම.
3. අධ්‍යාපන පද්ධතීන් තුළින් හා තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය පිළිබඳ අනෙකුත් සාධකයන් තුළ තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපන ක්‍රියාවලියෙහි ධාරිතාව වැඩිකිරීම.

## තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනයේ අරමුණු

පූර්ව ළමා විය අධ්‍යාපනයේ සිට වැඩිහිටි අධ්‍යාපනය දක්වා වූ සමස්ත අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ඒකමතික බවක් මේ පිළිබඳව පැවතීම අත්‍යවශ්‍ය වේ. කිසියම් රටක පාරිසරික, ආර්ථික හා සමාජීය අපේක්ෂණ හරහා තිරසර සංවර්ධනය සඳහා වූ



අධ්‍යාපනය පිළිබඳව දායක වියයුතු ආකාරය පැහැදිලි කරදීම මෙහි මූලිකම අපේක්ෂාව වේ.[15]

අධ්‍යාපනය තිරසර සංවර්ධනය සඳහා දායකවීමේදී පහත දැක්වෙන අරමුණු සාක්ෂාත්කරණයෙහි ලා සමත්වීම අත්‍යවශ්‍ය වේ.

1. අනාගත පරපුර සඳහා තිරසර සමාජයක් බිහිවීමට අවකාශ සලසා දීම.
2. පරිසරය ආර්ථිකය හා සමාජය පිළිබඳව ගෞරව සම්ප්‍රයුක්තව කටයුතු කරන පුරවැසියන් සහිත තිරසර අනාගතයක් පිළිබඳව අවබෝධය ලබා දීම.
3. තිරසර සමාජයක් නිර්මාණය කිරීමෙහිලා විශ්වීය වශයෙන් සිතිය හැකිත දේශීය වශයෙන් ක්‍රියා කළ හැකි නායකයන් බවට පත්විය හැකි පුරවැසියන් බිහිකිරීම.

## තිරසරත්වය සඳහා අධ්‍යාපනය ක්‍රියාත්මක විය යුතු අයුරු

අධ්‍යාපන තිරසරත්වය පිළිබඳ කේන්ද්‍රීය සාධකය වේ. සැබැවින්ම අධ්‍යාපනය සහ තිරසරත්වය වෙන්කළ නොහැකි පරිදි එකිනෙක බැඳී ඇත.

තිරසර සංවර්ධනය සඳහා කේන්ද්‍රීය වන්නේ අධ්‍යාපනයයි. සැබවින්ම මේ සංකල්ප ද්වය එකිනෙක බැඳී පවතින්නකි. නමුත් ඒ අතර පවත්නා විශේෂත්වය බොහෝදෙනෙකුට තේරුම්ගැනීමට අපහසු වූවකි. තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය දේශීය වශයෙන් හා සංස්කෘතික වශයෙන් උචිත වූ ආවේණික වූ අදහස් ප්‍රකට කරයි. මේ හා බැඳුණු සෑම අධ්‍යාපනික ක්‍රියාවලියක් මගින්ම දේශීය පරිසරය, ආර්ථිකය හා සමාජීය තත්වයන් සැලකිල්ලට ගත යුතුය. තිරසර සංවර්ධනය පිළිබඳව අවධානය මුලින්ම ප්‍රකට කරන ලද්දේ Agenda 21 හි 36 වන පරිච්ඡේදය මගිනි. මෙම පරිච්ඡේදය මගින් ඒ සඳහා වූ ප්‍රධාන පියවර සතරක් යෝජනා කරයි.

I. මූලික අධ්‍යාපනය සංවර්ධනය කිරීම.

II. පවත්නා අධ්‍යාපනය තිරසර සංවර්ධනයක් සඳහා පුනර් දිශාගත කිරීම.

III. මහජන අවබෝධය හා දැනුවත් කිරීම වර්ධනය කිරීම.

IV. මානව සම්පත පුහුණු කිරීම.

## I. මූලික අධ්‍යාපනය සංවර්ධනය කිරීම - පළමු ප්‍රමුඛතාව

තිරසර සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනික ක්‍රියාවලියේදී පළමු ප්‍රමුඛතාව හිමිවන්නේ මූලික අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යයටයි. මූලික අධ්‍යාපනය පිළිබඳ විෂය අන්තර්ගතය හා කාල පරාශය පිළිබඳව ලොව පුරාම විවිධ වෙනස්කම් පවතී. උදාහරණ වශයෙන් ඇතැම් රටවල ප්‍රාථමික අධ්‍යාපනයම මූලික අධ්‍යාපනය ලෙස පිළිගැනේ. තවත් රටක අවුරුදු අටක හෝ දොළසක මූලික අධ්‍යාපනයක් ක්‍රියාත්මක වෙයි. බොහෝ රටවල මූලික අධ්‍යාපනය කියවීම, ලිවීම, ගණිත හැකියාව ආදියට යොමු වී ඇත. පුවත්පත් කියවීම, ලිපි ලිවීම, මූලික ගිණුම් කටයුතු හා ප්‍රජාව තුළ හා තම ගෘහ ජීවිතය තුළ තමාට හිමි කාර්යභාරය හඳුනාගෙන කුසලතා වර්ධනය කරගැනීමට මූලික අධ්‍යාපනය තුළ පහසුකම් දැඩිව අත්‍යවශ්‍ය වේ. බොහෝ රටවල මේ වන විට ලබාදෙන මූලික අධ්‍යාපනය සාක්ෂරතාව වර්ධනය කළත් එපමණින්ම තිරසර සංවර්ධනය සහිත සමාජයක් බිහි නොවන බව හඳුනා ගැනේ. ලෝක ප්‍රජාව හා විවිධ ජාතීන් සිය තිරසර ඉලක්ක හඳුනාගෙන ඒ සඳහා කැපවී කටයුතු කළ යුතුය. එම යොමුවීම මගින් සිය කුසලතා හා අගයයන් වර්ධනය කරගන්නා අතරම මහජන සහභාගිත්වය හා ප්‍රජාව සතු තීරණ ගැනීමේ හැකියාව ද වර්ධනය කළ යුතු වේ. මේ සඳහා රටක අධ්‍යාපනය පුනර් දිශාගත කළ යුතු වන්නේ තිරසාරත්වය පිළිබඳ කාර්ය සම්බන්ධයෙන් විචාරාත්මක චින්තන කුසලතා, සංවිධාන කුසලතා, දත්ත හා තොරතුරු අර්ථකථනය කිරීමේ කුසලතා, ප්‍රශ්න විශ්ලේෂණාත්මක කුසලතා, විවිධ ප්‍රවේශ විශ්ලේෂණය කිරීම ආදිය පිළිබඳව සංවර්ධනයක් සිදු කරලීම අරමුණු කරගෙනය.[16]



මූලික අධ්‍යාපනයේ අන්තර්ගතය හා වැය කළ යුතු වසර ගණන ලොව පුරා විවිධ වේ. සමහරක් රටවල ප්‍රාථමික පාසල් අධ්‍යාපනයම මූලික අධ්‍යාපනය ලෙස සැලකේ. සමහර රටවල මූලික අධ්‍යාපනය කියවීම, ලිවීම හා ගණිතයට කේන්ද්‍රීය වේ. ශිෂ්‍යයෝ පුවත්පත් කියවීමට, අකුරු ලිවීමට, ඉලක්කම් ගණනයට හා ගෘහ ජීවිතයේ හා ප්‍රජා ජීවිතයේ පැවැත්මට අවශ්‍ය දේ උගනිති.

උදා :- ගැහැණු ළමයි පෝෂණය හා හෙදකම පිළිබඳව උගත්බව සඳහා යොමුවිය හැකිය. ශිෂ්‍යයෝ ඔවුන්ගේ ආණ්ඩු ක්‍රියාත්මක වන ආකාරය හා, සිය ප්‍රජාවෙන් ඔබ්බට ගිය ලෝකය පිළිබඳව උගනිති.

මූලික සාක්ෂරතාව වර්තමානයේ බොහෝ රටවල උගන්වන්නාක් මෙන්ම තිරසර සමාජ ඉහළ මට්ටමකට ගෙන ඒමට උපකාරී නොවේ. සැබවින්ම ප්‍රජාවක් හා ජාතීන් තිරසර සංවර්ධනයේ අරමුණු හඳුනාගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ඔවුන් කුසලතා, අගයයන් හා මහජන සහභාගිත්වය හා ප්‍රජා තීරණ ගැනීම උනන්දු කරවන්නාවූ හා එයට සහාය වන්නා වූ දෘෂ්ටිකෝණ පිළිබඳව අවධානය යොමුකළ යුතුය. මෙම ඉලක්ක සාධනය සඳහා මූලික අධ්‍යාපනය පුනර් දිශාගත කළ යුතු වේ.

පෙර දක්වූ පරිදි තිරසරත්වය හා විවේචනාත්මක චින්තන කුසලතා, දත්ත හා තොරතුරු විශ්ලේෂණය හා සංවිධාන කුසලතා, ප්‍රශ්නකරණය පිළිබඳ කුසලතා මෙන්ම ප්‍රජාව මුහුණදෙන ගැටලු විශ්ලේෂණයට අදාළ කුසලතා ද වර්ධනය කළ යුතු බව අවධාරිතය.

බොහෝ රටවල වර්තමාන මූලික අධ්‍යාපනය පහළ මට්ටමක පවතිනුයේ තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික සැලසුම් වලට බාධක වශයෙනි. ලතින් ඇමරිකාවේ හා කැරිබියන් දූපත් වල හා බොහෝ රටවල අවු. 6 සිට 8 දක්වා අධ්‍යාපනය අනිවාර්ය වන අතර අවම වශයෙන් 5% සිට 15% දක්වා අවුරුද්දක් හෝ ඊටත් වඩා දිගු කාලයක් එකම පන්තියේ සිටිති. ආසියාවේ සමහර කොටස්වල විශේෂයෙන් බංගලාදේශය, පාකිස්ථානය හා

ඉන්දියාව අවුරුදු 5 දී සාමාන්‍ය වශයෙන් පාසලට පිවිසෙති. මෙම තීරයේ බොහෝ ගැහැණු ළමයි අඩු වසර ගණනක් පාසල් යති. එම සාමාන්‍ය ලබාගැනීමට අප්‍රිකාවේ කොටස්වල නියඟය හා යුද්ධය නිසා බාධිත වූ ජීවිත පොදු අධ්‍යාපනය සඳහා පැමිණීම මාසිකව මනිනු ලැබේ. අවාසනාවකට මෙන් අධ්‍යාපනය පිළිබඳව පහළම ගුණාත්මක තත්වයන් සොයාගනු ලබන්නේ දුප්පත්ම ප්‍රජාවන් හා ප්‍රදේශ වෙතිනි. ගුණාත්මක බව අඩු අධ්‍යාපනය රටක තිරසර සංවර්ධනය සම්බන්ධ කෙටි කාලීන හෝ දිගු කාලීන සැලසුම් සංවර්ධනය කරගැනීමට ඇති අවස්ථා දැඩි ලෙස සීමා කරයි.

1990 දී හා නව සහශ්‍රකයේදී ඇතැම් ජාතීන් අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කිරීම නිසා ඔවුන් මූලික අධ්‍යාපනය පිළිබඳව වැඩි දියුණුවක් ලබා ඇත. ඇත්තෙන්ම ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශවීම ලොව බොහෝ රටවල වැඩිවී ඇත. ගැහැණු ළමුන්ගේ ප්‍රවේශය පිරිමි ළමුන්ට වඩා වැඩිවී ඇත. මෙය ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ පරතරය අඩු කිරීමට ද හේතු වී ඇත. විශ්වීය වශයෙන් ගත් කල්හි ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ පරතරය ප්‍රාථමික හා ද්විතියික පාසල්හි පටුවෙමින් පවතී.

## II. අධ්‍යාපනය පුනර් දිශාගත කිරීම - දෙවැනි ප්‍රමුඛතාව

අධ්‍යාපනය පුනර් දිශාගත කිරීම අධ්‍යාපන පරිපාලකයන්ට හා අධ්‍යාපනඥයන්ට හැම ලෙසකින්ම අවශ්‍ය වෙනස්කම් කිරීම සඳහා බෙහෙවින් උපකාරී වේ. උචිත ලෙස පුනර් දිශාගත කෙරුනු අධ්‍යාපනයට තිරසර සංවර්ධනය හා බැඳුණු බොහෝ මූලධර්ම, කුසලතා, දෘෂ්ටිකෝණයන් හා අගයයන් ඇතුළත් විය යුතුය. එසේ කිරීමේදී අධ්‍යාපනයේ ගුණාත්මක බව දියුණු කිරීම පමණක් නොව උචිත බව හා අදාළත්වය කෙරෙහිද අවධානය යොමු විය යුතුය. තිරසර සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනය, පරිසරය, ආර්ථිකය හා සමාජය ඒකාබද්ධව කළ යුතුය. පුනර් දිශාගත කෙරෙන අධ්‍යාපනය මගින් මිනිසුන් තුළ තිරසර සංවර්ධනය ගැන අභිප්‍රේරණයක් ඇති කරන, තිරසර සංවර්ධිත ජීවන රටාවක

06 JUN 2014



අගය ඒත්තු ගන්වන, තිරසර ලෙස ජීවත් වීමට අවශ්‍ය ඉගෙනුම්, ඉගැන්වීම්, දැනුම කුසලතා, දෘෂ්ටීන් හා අගයයන් වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. මූලික හා ද්විතීයික අධ්‍යාපනය පුනර් දිශාගත කිරීමට අවශ්‍ය වන්නේ තිරසාරත්වය පිළිබඳව ජාත්‍යන්තර අවධානය යොමුව ඇති නිසාය. සමාජයේ අනාගත නායකයන් හා තීරණ ගන්නවුන් අධ්‍යාපනය ලබන්නේ මෙම අධ්‍යාපන ක්‍රමය තුළය. මෙම කරුණ ජනතාව සමාජයේ සෑම අංශයෙන්ම මෙහෙයවීමට අපේක්ෂා කරන්නේ නම් - (උදාහරණ :- ආණ්ඩුව, වෛද්‍ය, කෘෂිකර්මය, වනාන්තර, නීතිය, ව්‍යාපාර, අධ්‍යාපනය, සන්නිවේදනය, ගෘහනිර්මාණය හා කලාවන්) මෙලෙස තිරසරත්වය උදෙසා සියලුම අංශයන්, වර්තමාන පරිපාලන හා පීඨ නියෝජිතයන් විශ්වවිද්‍යාල විෂයය මාලාව නැවත සැකසිය යුතුය.

තිරසර සමාජයක් බිහිකිරීමට නම් අධ්‍යාපනය පුනර් දිශාගත කිරීමේදී වැඩසටහන් සැලසුම් කරන්නන් සාම්ප්‍රදායික පාරිසරික දැනුම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. ඒ ස්වදේශීය සම්ප්‍රදායන් නිතරම පාහේ තිරසර සම්පත් භාවිතය පිළිබඳව ද ආදර්ශ ප්‍රකට කරන හෙයිනි.

අධ්‍යාපන පුනර් දිශාගත කිරීමේදී තිරසරත්වය යන්න විධිමත් අධ්‍යාපන පද්ධතියක් ඔස්සේ විශ්වවිද්‍යාල හා වෘත්තීය පාසල් කාර්මික විද්‍යාල අධ්‍යාපනය ගැනද ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට අතිරේකව සැලකිලිමත් විය යුතුය.[17]

## III. පොදු ජනතාව තුළ අවදිබව හා අවබෝධය ඇති කිරීම - තුන්වැනි ප්‍රමුඛතාව

තිරසර සමාජයක ඉලක්ක පිළිබඳව හා එම ඉලක්ක සපුරා ගැනීමට දායක විය හැකි, දැනුම හා කුසලතා සහිත ජනගහනයක් තිරසරත්වය උදෙසා අවශ්‍ය වේ. දැනුවත් භාවයෙන් යුතු, ඡන්ද බලය හිමි පුරවැසියන් ප්‍රජාතන්ත්‍රීය ආණ්ඩු සංඛ්‍යාව වැඩි කිරීම සඳහා වඩාත් වැදගත් වේ. එවැනි ඡන්ද දායක පුරවැසියෙකු රජයට උදව් කිරීමට පිළිවන් තිරසර

සංවර්ධනය පිළිබඳව දැනුමැති පාරිභෝගිකයන් බවට පත්විය යුතුය. අදට නම් මහජනතාව මාධ්‍ය සාක්ෂරතාව (Media Literacy) යෙන් සමන්විතය. ඔවුන් අද රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, සඟරා හා දැන්වීම්, අන්තර්ජාලය ආදී වශයෙන් විවිධ මාධ්‍යයන් මගින් වෙලා ගනු ලැබ ඇත.

## IV. පුහුණුව - සිව්වැනි ප්‍රමුඛතාව

Chapter 36 - හිදී පුහුණුව පිළිබඳ අවධානය යොමු කෙරේ. සාක්ෂරතාව සහිත හා පාරිසරික වශයෙන් අවදි බව සහිත පුරවැසියෙකු ඔවුන්ගේ තිරසර සංවර්ධනය පිළිබඳ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වේ. හැම අංශයක්ම එනම් ව්‍යාපාරික, කාර්මික, උසස් අධ්‍යාපනය, රාජ්‍ය, රාජ්‍ය නොවන හා ප්‍රජා සංවිධානයන් ඔවුන්ගේ නායකයන් පුහුණු කිරීමට හා පාරිසරික කළමණාකාරිත්වය පිළිබඳව ඔවුන්ගේ වැඩකරුවන් පුහුණු කිරීමට උනන්දු වේ.

පිළිගත් පුහුණුවීම් සඳහා සහ ක්‍රියාකාරකම් සඳහා ඔවුනට සුවිශේෂී ක්‍රියාකාරකම් කිරීමට අවශ්‍ය කුසලතා ලබාදීම පුහුණුව මගින් අපේක්ෂා කෙරේ.

අනෙක් අතට අධ්‍යාපනය සමාජීය සම්ප්‍රේෂණ ක්‍රියාවලියකි. එමගින් ජනතාවට දැනුම, කුසලතා, දෘෂ්ටීන්, හා අගයයන් ලබාදේ. එසේ කරනුයේ ඔවුනට ඔවුන්ගේ යහපැවැත්ම උදෙසා හා ඔවුන්ගේ ප්‍රජාවේ හා ජාතියේ යහපැවැත්ම උදෙසා සහභාගීවීමට හා දායක වීමටය.[18]

### සමාලෝචනය

සෑම ප්‍රජාවකගේම යහපැවැත්ම උදෙසා වන දිගුකාලීන අනාගතයක් සහිත ආර්ථික, පාරිසරික හා සමාජ යහපැවැත්ම සඳහා වන තීරණ ගන්නේ කෙසේද යන්න පිළිබඳ වූ ඉගෙනුම් ක්‍රියාවලියක් ලෙස තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපන ක්‍රියාවලිය ක්‍රියාත්මක කෙරේ. එවැනි අනාගතයක් පිළිබඳව



අභිමුඛ වූ අධ්‍යාපනයක් පිළිබඳව යොමුවීම තිරසර සංවර්ධනය සඳහා වන අධ්‍යාපනයේ මූලික කාර්ය ද වේ.

තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය, අධ්‍යාපනය පිළිබඳ නව දැක්මක් නියෝජනය කරයි. එම දැක්ම සිසුන්හට ඔවුන් ජීවත් වන ලෝකය පිළිබඳව වඩාත් හොඳ අවබෝධයක් ලබා දේ. දිළිඳු බව, නාස්තිකාර පරිභෝජනය, පාරිසරික අවනතිය, නාගරික පරිහානිය, ජනගහන වර්ධනය, සෞඛ්‍යය, ගැටුම්, මානව අයිතිවාසිකම් උල්ලංඝනය ආදී අපේ අනාගතය තැතිගන්වන සුළු සංකීර්ණ හා එකිනෙක බැඳුනු ගැටලු පිළිබඳව අවධානය අවදි කරවයි.

අධ්‍යාපනය පිළිබඳ මෙම නව දැක්ම මගින් අවධාරණය කරනුයේ සාකල්‍යවාදී හා අන්තර් ශික්ෂණමය ප්‍රවේශයකි. එමගින් තිරසර අනාගතයක් සඳහා දැනුම කුසලතා මෙන්ම ඇගයුම් චර්යාවන් හා ජීවන රටාවන්හි වෙනසක් ඇති කිරීම සඳහා අවශ්‍ය දැනුම කුසලතා සංවර්ධනය කිරීම අවධාරිතය.

මේ සඳහා අධ්‍යාපන පද්ධතීන් ප්‍රති දිශාගත කිරීම සඳහා තරුණ මහලු ආදි සෑම දෙනා කෙරෙහිම බලය පවරනු ලබන ප්‍රතිපත්ති හා භාවිතයන් අත්‍යවශ්‍ය වේ. මෙහිදී අනාගතය තැතිගන්වන ගැටලු අඩුකිරීමට හැකි සංස්කෘතික වශයෙන් උචිත හා දේශිය වශයෙන් ගැලපෙන තීරණ ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට එකී බලය පැවරිය යුතු වේ. මේ ලෙස සෑම වයසකම ජනතාවට තිරසර සංවර්ධනය සහිත අනාගතයක් පිළිබඳ විකල්ප දැක්මක් වර්ධනය කරගැනීමට මෙන්ම මෙම දැක්ම සපුරාගැනීම සඳහා නිර්මාණශීලිව අන් අය සමග කටයුතු කිරීමට ද බලාත්මක බවක් ඇති කළ යුතුය.[19]

සමස්තයක් ලෙස ගත්කල්හි තිරසර සංවර්ධන සංකල්පය මෙන්ම තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය යන සංකල්පයන් ද ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ අවධානයට ලක්වන්නේ ඉතා අල්ප වශයෙන් බව පැවසිය හැකිය. පාසල් විෂයමාලාව තුළ සැබැවින්ම අන්තර්ගත විය යුතු මෙම අගනා සංකල්පය හා

ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳව අවධානය යොමු වී නැති තරම් බව පැවසීම සාධාරණය.

තිරසර සංවර්ධනය පිළිබඳ සංකල්පය අපට ආගන්තුක වූවක් නොවේ. විශේෂයෙන් බෞද්ධ දර්ශනයෙන් පෝෂිත සමාජයකට මෙම සංකල්පය ආශ්‍රිත ක්‍රියාකාරකම් පහසුවෙන් අන්තර්ග්‍රහණය කළ හැකි බව විද්වතුන්ගේ අදහස වේ. මෙම සංකල්පයේ මුඛ්‍ය අරමුණ වන සම්පත් පරිභෝජනය පිළිබඳව පැවතිය යුතු සංරක්ෂණශීලි පිළිවෙත බුදුදහම ප්‍රකට කරන්නේ ශතවර්ෂ විසිපහක් තරම් ඈත අතීතයකදී බව පැවසීම යුක්ති යුක්තය.

බුදුදහම පාරිසරික, ආර්ථික, සමාජීය වශයෙන් සමාජයක පැවතිය යුතු සංරක්ෂණශීලි පිළිවෙත් පිළිබඳව දක්වන විවරණයන්ගෙන් පරිපූර්ණ වේ. එම විවරණ මගින් ප්‍රකට කෙරෙන අගනා මගපෙන්වීම් තිරසර සංවර්ධනය සංකල්පය ආශ්‍රිත ක්‍රියාකාරකම් ශ්‍රී ලාංකේය සමාජ සංදර්භය තුළ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි බව පර්යේෂකයා විශ්වාසය පළකරයි. ඒ සඳහා උචිත අධ්‍යයනයක් සිදුකිරීම කාලීන අවශ්‍යතාවක් ද වේ.

තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය පිළිබඳ හැඳින්වීමක් නම්වූ මෙම ලිපියෙන් ප්‍රයත්න දැරුයේ එය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව ඒ හා සම්බන්ධව විවිධ පර්යේෂකයන් විසින් හා ජාත්‍යන්තර කමිටු විසින් ඉදිරිපත් කර ඇති වාර්තා, තොරතුරු ආදිය පිළිබඳව අධ්‍යයනයක යෙදීම තුළින් එම සංකල්පය පිළිබඳ මූලික පර්යේෂණයක් සිදුකිරීමය.



## ආන්තික සටහන් :-


1. *Report :- World Commission on Environment;* 1987

2. Finn Denovan, *Our uncertain Future; Can good planning create Sustainable communities? ;* University of Illinois; 2009,P.03.

3. Ebnert; Ina; *Sustainable Human Resource Management, A conceptacles & Exploratory Analysis from a Paradox Perspective,* Springer; 2009; PP 35 - 36.

4. Grober, Ulrich, *Deep Roots, A Conceptual History of "Sustainable Development"* 2007; PP. 8-9.

5. Ebnert, Ena, *Sustainable Human Resource Management; A Conceptual & Exploratory Analysis from a Paradox Perspective;* Springer; 2009, PP. 35 - 36.

6. Finn; Denovan; *Our Uncertain Future; Can good Planning create Sustainable Communities? ;* University of Illinois; 2009; P. 03.

7. Rogers, Peter P; Jalal Kazi F, Boyd Jhon A; *An Introduction to Sustainable Development,* Glen Educational Foundation; USA; 2008; P. 42

8. McKeown, Rosalyn; *Education for Sustainable Development Toolkit;* Version 2; 2002; P.08

9. Munasinghe, Mohan; *"Environmental Economics & Sustainable Development"; World Bank Environment Paper,* No. 3, Washington, D. C, World Bank, 1993.

10. Repetto; Robert; C; *World Enough & Time: Successful Strategies for Resource Management;* New Haven; Yale University Press; 1986.

11. *Reo Declaration on Environment & Development,* adopted at the U.N.O. Conference on Environment & Development, 31 ILM 874; 1992.

12. *Agenda 21; Rio Conference;* 1992.

13. McKeown; R; *Education for Sustainable Development Toolkit,* Version 2; P.10.

14. *Training Manual on Education for Sustainable Development;* National Institute of Education, Maharagama, P. 03.

15. *Training Manual on Education for Sustainable Development;* National Institute of Education, Maharagama, P. 04.

16. MC Keown; R, *Education for Sustainable Development Toolkit,* version 2; P.14

17. MC Keown; R, *Education for Sustainable Development Toolkit,* version 2; P.15

18. MC Keown; R, *Education for Sustainable Development Toolkit,* version 2; P.16

19. *Education for Sustainability; Report; World Summit on Sustainable Development* Johannesburg, 26 Agust - 4 September 2002- P. 10